


**ශ්‍රී. බු. ව. 2560 ක්වූ මැදින් මස කලාපය, රා. ව. 2017 ක් වූ මාර්තු මස 12 වන දින**

**මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති**

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# අඳුරෙන් එළියට අවුත් ආලෝකවත් ජීවිතයක් ඇතිකර ගනිමු.

**"චතතාරො මෙ භිකඛවෙ පුගගලා සනෙතා සංවිජජමානා ලොකසමිං කතමෙ චතතාරො? තමො තමපරායනො තමො ජොති පරායනො, ජොති තම පරායනො, ජොති ජොති පරායනො."**

**"මහණෙනි මේ ලෝකයෙහි පුද්ගලයින් හතර දෙනෙක් දැකිය හැකිය. ඒ හතර දෙනා කවරේද ? අඳුරෙන් අඳුරට යන අඳුරෙන් එළියට යන එළියෙන් අඳුරට යන එළියෙන් එළියට යන පුද්ගලයින්ය.**

(අඞ්ගුත්තර නිකාය චතුක්කනිපාත - තමෝ තම පරායන සූත්‍රය)

**ගරු ස්වාමීන්වහන්ස/ පින්වත්නි,**

**අද මැදින් පුර පසළොස්වක පොහොය දිනයයි. සුද්ධෝදන පියරජතුමාගේ ආරාධනය මත ගෞතම බුදුරජානන් වහන්සේ කිඹුල්වත් පුර නුවරට වැඩම කිරීමට ආරම්භ කළේ අද වැනි මැදින් පුර පසළොස්වක පොහොය දිනයකය. තම පුතණුවන් බුදු බවට පත්වී රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ සිටින බව දැනගත් පිය රජතුමා එක් ඇමතිවරයෙකුට පිරිවර දහස බැගින් දී බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුර නුවරට වැඩමවා ගැනීමට උත්සාහ කළත් ඒ සියලුම උත්සාහයෝ අසාර්ථක විය. ඊට හේතුව තමාගේ පණිවිඩය නොකියාම ඒ පිරිස පැවිදිවීමයි. සුද්ධෝදන රජතුමා දසවන වතාවට සිදුහත් කුමරු සමග එකම දින උපන් කාළුදායි ඇමතිවරයා දහසක් පිරිවර සමග මේ සඳහා යැවීමට තීරණය කළේය. පැවිදි වීමේ අවසරය ලබාගෙන කාළුදායි ඇමතිවරයා බුදුන්වහන්සේ වෙත ගොස් පැවිදි වී ගාථා 10 කින් කිඹුල්වත් පුර නුවරට යන මාර්ගයේ තිබෙන විසිතුරු වර්ණනා කළ බව කාළුදායි ථේර ගාථාවේ සඳහන් වේ.**

'' භාග්‍යවත් බුදුපියාණන් වහන්ස, කිඹුල්වත්පුර නුවරට යන මාර්ගයේ ගස්වල පැරණි කොල බිම වැටී අලුත් දලු දමා ගිනි අඟුරු මෙන් දිලිසෙමින් තිබෙන්නේ මල් ඵල හටගැනීමේ අපේක්ෂාවෙනි. ඒ වෘක්ෂයෝ පහන් සිළුමෙන් බබළති. ශාක්‍යයන්ට උපකාර පිණිස මේ සුදුසුම කාලයයි.

''අඞගාරිනොදනි දුමා හදනෙත - ඵලෙසිනො ඡදනං විපපහාය

තෙ අච්චිමනෙතා'ව පභාසයනතී - සමයො මහාවීර භගීරථානං''

(කාළුදායි ථේර ගාථා)

ශාක්‍යයෝ එදා යුගයේ මානාධික පිරිසක් හැටියට ජීවත්වූ බව විවිධ තොරතුරු වලින් සිතාගත හැක. එවැනි අඩුපාඩුකම් කාළුදායි හිමියන් දුටුවේ ගස්වල පැරණි කොළ හැටියටයි. එම කොළ ඉවත්වී අලුත් මල් සහ ගෙඩි හටගැනීම ඒ හිමියන් දුටුවේ ශාක්‍යයින් තම පැරණි අදහස් ඉවත දමා තම ශාක්‍ය කුලයෙන්ම බිහිවූ බුදුරජාණන්වහන්සේගේ නව චින්තනය පිළිගැනීමට සූදානමින් සිටිනා බවයි. යමක් කෙලින්ම නොකියා ව්‍යංගයෙන් කීම කවිකලාවේ ලක්ෂණයකි. කාළුදායි හිමියන්ගේ මේ කවි සංකල්පනාව නිසා බුදුපියාණන් වහන්සේ තමා උපන් ගමට පාගමනින්ම වැඩම කිරීමට පිටත් වූයේ අද වගේ පෝය දිනයකය.

අඩුපාඩුකම් අප කා අතරත් දැකිය හැක. එසේ නොවන්නට නම් රහත් භාවයට පත්විය යුතුයි. එම අප අතර තිබෙන අඩුපාඩුකම් බුදුපියාණන්වහන්සේ දුටුවේ අඳුර හැටියටයි. පුද්ගලයා අන්ධකාරයෙන් ආලෝකය කරා ගෙන යාමට නම් එම අඩු පාඩුකම් ඉවත්කර ගත යුතුයි. තමෝතම පරායන සූත්‍රය ආශ්‍රය කරගෙන අද අප බලාපොරොත්තුවන්නේ අන්ධකාරයෙන් ආලෝකය කරා ගමන් කිරීමට අවශ්‍ය කරන උපදෙස් ලබා දීමටයි.

මෙම සූත්‍රයට අනුව සමාජයේ ජීවත්වන ගිහි පැවිදි සියලුම දෙනා මේ කොටස්වලින් එකකට අයත්වෙති. මෙම සූත්‍රයෙහි විස්තර කරන්නේ තමෝ සහ ජෝති යන වචන දෙකයි. තමෝ යන වචනයෙන් අඳුරත්, ජෝති යන වචනයෙන් ආලෝකයත් හඳුන්වා දී තිබේ. එම අඳුර සහ ආලෝකය සූත්‍රයට අනුව සරළව තේරුම් ගැනීමට බලමු.

මෙලොව ජීවත්වන සමහර කෙනෙක් කෑම් බීම් හරියට නොලැබෙන, ඇඳුම් පැළඳුම් අඩු, දුකසේ ජීවිතය ගතකරන සැඩොල් කුලයෙහි හෝ කුළුපොතු කුලයෙහි හෝ වැදි කුලයෙහි හෝ රථකාර කුලයක හෝ කසලසෝධක කුලයක හෝ උපදිති. ඔහු දුර්වර්ණය, දැකීමට අප්‍රිය වේ. ඉතා මිටි වූයේ වෙයි. බොහෝ ලෙඩ රෝගවලින් පෙළෙන්නෙකි. දෙ ඇස් නොපෙනෙයි. වක් වූ අත් පා ඇති කෙනෙක් වෙයි. කොරවූ කෙනෙක් වෙයි. ශරීරයෙන් එක පැත්තක් පණනැතිවීම නම් වූ පක්ෂඝාතය නම් රෝගයට ගොදුරු වූ කෙනෙක් වෙයි. ඔහුට කෑමක් බීමක් ඇඳුමක් පැළඳුමක්, මල්ගඳ විලවුන් දැරීමක්, හරියට සැපසේ නිදා ගැනීමක් නැත. මනුෂ්‍යයෙකුට අවශ්‍ය කරන කිසිදු අවශ්‍යතාවයක් නොලැබෙන මෙවැනි පුද්ගලයින්ගේ ජීවිත මේ සූත්‍රය සඳහන් කරන්නේ අඳුරු ජීවිත ලෙසයි. එවැනි අඳුරු ජීවිත ගතකරන අය නැවතත් අඳුරට යන බව මෙම සූත්‍රය පැහැදිලිකර දෙයි. ඒ අඳුර කුමක්ද එවැනි පුද්ගලයා කයින්,වචනයෙන්,සිතින් දුසිරිතෙහි හැසිරෙයි. එසේ හැසිරීමේ ප්‍රතිඵලය ලෙස ඔහු මිනිස් ලොවින් ඈත්වී කිසිදු සැපතකින් තොර සදා දුක් ඇති නරකයෙහි ගොස් උපදී. මේ අඳුරෙන් අඳුරට යන තමෝ තම පරායන පුද්ගලයාගේ සවභාවයයි.

මෙම සූත්‍රය සඳහන් කරන දෙවන පුද්ගලයා මුලින් සඳහන් කළ පරිදි අඳුරේ ඉපදී ඇති නමුත් ඔහු ආලෝකය කරා ගමන් කරයි. එහි ආලෝකය වශයෙන් දක්වා ඇත්තේ කයින්, වචනයෙන් සහ සිතින් සුචරිත ජීවිතයක් ගත කොට මරණින් මතු සියලු සැපතින් පිරි දිව්‍ය ලෝකවලට සැපත් වන බවයි. මේ තමෝ ජෝති පරායන පුද්ගලයාගේ සවභාවයයි.

මෙහි සඳහන්වන තුන්වන පුද්ගලයා ආලෝකයෙන් අඳුරට යන පුද්ගලයායි. මෙහි ආලෝකය යනුවෙන් දක්වා ඇත්තේ කුමක්ද කියා විමසා බලමු. මේ ලෝකයෙහි සමහර කෙනෙක් ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති වැනි මහාසාර කුලයක උපදී. ඔහුට රන් රිදී මුතු මැණික් බොහෝ ධන ධාන්‍ය ඇත. දකින්නාට ප්‍රිය වූ, ප්‍රසාදය එළවන, ඉතා ලස්සන රූපයක් ලැබී තිබේ. කෑම් බීම්, ඇඳුම් පැළඳුම් ඉඳුම් හිටුම්, මල්ගඳ විලවුන් වලින් යුක්ත ඉතා නීරෝගී ජීවිතයක් ගත කරයි. නමුත් ඔහු කයින් වචනයෙන් සහ සිතින් දුෂ්චරිත දේ කරයි. ඒ නිසා ඔහු හඳුන්වා ඇත්තේ එළියෙන් අඳුරට යන පුද්ගලයා හැටියටයි. මේ සූත්‍රයට අනුව ඔහු ජෝති තම පරායන පුද්ගලයායි.

මෙහි සඳහන්වන හතරවන පුද්ගලයා ආලෝකයෙන් ආලෝකයට ගමන්කරන පුද්ගලයායි. ඔහු ඉතාම ඉහළ කුලයක උපදී. කෑම් බීම් ඇඳුම් පැළඳුම් ආදී මිනිස් අවශ්‍යතාව වල කිසිදු අඩුවක් නැත. දකින  අයගේ සිත් සතන් ප්‍රබෝධමත් කරවන රූපයකින් යුක්තය. නීරෝගීව ජීවත්වන ඔහු ජීවත්වන්නේ ආලෝකය තුලය. ඔහු තිදෙරින් යහපත් ක්‍රියා කරමින් මරණින් මතු සැප ඇති දිව්‍යලෝකයකට පැමිණ, සැපසේ ජීවත් වේ. මෙම සූත්‍රය සඳහන් කරන එළියෙන් එළියට ගමන්කරන ජෝති ජෝති පරායන පුද්ගලයාගේ සවභාවය මෙයයි.

ලෝකය තුළ ජීවත්වන පුද්ගල ප්‍රභේද හතරක් ගැන සමාජය දැනුවත් කර අඳුරේ ජීවත්වන පුද්ගලයින් ආලෝකය කරා පමුණුවා ලීම මෙම සූත්‍රයෙහි අරමුණය. මෙහි අඳුර ගැන නිර්වචනය කරන තැන සඳහන් වන කුලය පිළිබඳ අදහස ගැන බොහෝ දෙනෙකුට ගැටලුවක් ඇති වීමට පුළුවන. කුලය පිළිබඳ සැළකීමක් නැති තථාගයන් වහන්සේ මෙවැනි දෙසුමක් කර ඇත්තේ කවර අපේක්‍ෂාවකින්ද මේ ප්‍රශ්නය ගිහි පැවිදි හැමෝටම සාධාරණව මතුවිය හැකිය.  බුදුරජාණන් වහන්සේ කුලය පිළිබඳ මධ්‍යස්ථව ක්‍රියා කරන ශාස්තෘවරයෙකි. නමුත් මෙතන අඳුර යන වචනයෙන් විස්තර කර ඇත්තේ එදා භාරතය තුළ පැවති සාමාන්‍ය මිනිසුන් ඉදිරිපත් කර ඇති චින්තනයයි. පහත් යයි එදා සම්මත කර ගෙන තිබූ රැකියා මෙහි සඳහන් කොට ඇත. ඒවා බුදුපියාණන් වහන්සේගේ අදහස් නොවේ. භාරතීය ජනතාව තුළ පැවති අදහස්ය. ගෞතම බුදුරජාණන්වහන්සේ මෙහි සඳහන්කර තිබූ එකද රැකියාවක්වත් පහත් කොට සලකා නැත. ඒ සියලුම රැකියා සමාජ අවශ්‍යතාවෝය. උදාහරණයක් හැටියට රටේ පවත්නා කැලි කසල ඉවත් කරන පිරිස නැති උනොත් ඒ රටේ මිනිසුන්ට ජීවත්විය හැකිද? ඒ නිසා බුදුදහම මේ කිසිදු රැකියාවක් හෝ එම රැකියාවල නිරතවන කිසිවෙක් පහත්කොට සලකා නැත. නමුත් මෙම සූත්‍රයේ අඳුර ගැන විස්තර කරන තැන සඳහන් වී ඇත්තේ එදා කුලය පිළිබඳ වූ සමාජමය පිළිගැනීමයි. අලෝකය ගැන විස්තර කරන තැන ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති යන මහාසාල කුල දක්වා ඇත. එයද බුදුන්වහන්සේගේ පිළිගැනීමක් නොවේ. සමාජමය පිළිගැනීමකි. මේ පිළිබඳ බෞදධ අදහස වන්නේ පුද්ගලයා හිතා මතා කරණු ලබන කර්ම තුළින් පුද්ගලයා විවිධ කුලවලට බෙදී ඇති බවයි. ජාතියෙන් වසලයෙකු හෝ බ්‍රාහමණයෙකු නොවන බවත්, කරන කර්මයෙන් එසේ බෙදුමක් ඇතිවන බවත් බුදුදහමේ අදහසයි.

අද වගේ මැදින් පුර පසළොස්වක පොහොය දිනයක බුදුන්වහන්සේ තම ඥාතීන්ට සංග්‍රහ පිණිස කිඹුල්වත් පුර නුවරට වැඩම කළේ තම පියාණන් ඇතුළු ඥාතීන් අඳුරෙන් ආලෝකය කරා පමුණුවා ලීමටයි. භාරතයේ සමහර යුගවලදී බ්‍රාහමණ කුලයද සමහර යුගවලදී ක්‍ෂත්‍රිය කුලයද පෙරමුණ ගෙන තිබේ. බුදුන්වහන්සේ වැඩසිටි යුගයේදී ඉදිරියට පැමිණ තිබුණේ ක්‍ෂත්‍රිය කුලයයි. ඛත්තියා - බ්‍රාහමණා - වෙසසා - සුදද යනුවෙන් බොහෝ බෞදධ සූත්‍ර ධර්මවල සඳහන් වේ. බුදුදහම කුලවතා ලෙස සලකන්නේ තිදොර සංවර කරගත් පුද්ගලයාටයි. ඒ නිසා කුලභේදය නැමති මිත්‍යා සංකල්පය සමාජය තුළින් ඉවත්කර එම අඳුරෙන් ආලෝකය කරා ගමන් කිරීමට කාලය උදාවී ඇත. නූතන ශ්‍රී ලංකාවේ සමහර කුල ඒකරාශී කරන සංවිධාන බිහි වී ඇත. එම සංවිධාන මගින් තම කුලයේ අයට විවිධ

වරප්‍රසාද ලබා දෙන බවටද ආරංචි ලැබී තිබේ. ගිහි වශයෙන් හෝ පැවිදි වශයෙන් කවුරු හෝ මෙවැනි දේ කරන්නේ නම් බෞද්ධ කමට කිසිසේත් නොගැලපෙන බව සිතට ගත යුතුයි. ඒ නිසා තම තමාගේ උගත්කම, හැකියාව මත කරන රැකියාවට අනුව කුලයක් නියමවීම සාමාන්‍ය සිරිතයි. එසේ නොමැතිව අසවල් කුලය ඉහළය. අසවල් කුලය පහත්යයි බුදුදහම කිසිසේත් අනුමත නොකරයි.

බොහෝ සූත්‍ර ධර්ම අවසානයේදී එය අසා සිටින ගිහි පැවිදි බොහෝ දෙනා කරන පොදු ප්‍රකාශනයක් දැකිය හැක. "අන්ධකාරෙවා තෙල පජ්ජෝතං ධාරෙය්‍ය" යනුවෙන් දැක්නෙ එම ප්‍රකාශයෙන් කියවෙන්නේ තථාගතයන් වහන්සේගේ ධර්මය අඳුරේ සිටින කෙනෙකුට තෙල් පහනක් දල්වා මේ මේ රූප බලාගනිත්වායි ඇරයුම් කිරීමක් වැනි බවයි. අපවත් වී වදාළ ගංගොඩවිල සෝම නාහිමියන් ජීවත්ව සිටි කාලය තුළ තම දේශනාවන් සිදුකළේ ගිහි පැවිදි හැම දෙනාම අඳුරෙන් එළියට ගැනීම සඳහායි. උන්වහන්සේ ජීවත්ව සිටි කාලය තුළ තරමක් සමාජයේ මේ අඳුර හඳුනාගෙන ක්‍රියා කළත් නූතනයේ නැවතත් එම අඳුරු මිත්‍යා මත සමාජය පුරා පැතිරී තිබේ. කෙනෙකු ඇස් මට්ටමින් ඈත්වී ගිය පසු මනසින් ඈත්වීම ඉතා ඉක්මනින් සිදුවේ. ගංගොඩවිල සෝම සවාමීන්වහන්සේටද සිදු වී ඇත්තේ එයයි. නමුත් කරුණු අවබෝධ කරගෙන ජීවත්වන බොහෝ ගිහි පැවිදි පිරිස් සෝම නාහිමියන් අමතක නොකොට මිත්‍යා මතවලින් මිදී අලෝකවත් ජීවිත ගත කරති. එවැනි අය අඳුරෙන් මිදී ගත කරන ආලෝකවත් ජීවිත වලට ආශීර්වාද කළ යුතුයි.

මෙම සූත්‍රය සඳහන් කරන ආලෝකවත් ජීවිත ගත කරන අයට සමාජමය වශයෙන් ලැබිය යුතු සියලු වරප්‍රසාද ලැබී තිබේ. ඒවාට හේතුව ලෙස දැක්විය හැක්කේ පුද්ගලයා සිතා මතා කරන යහපත් කර්මයෝය. එසේ ජීවත්වන හැම දෙනාම තිදෙර සංවර කරගෙන යහපත් කර්ම කිරීම තමා ලබා තිබෙන යහපත් තත්ත්වය සවිර කරගැනීමක් ලෙස දැක්විය හැක. එවැනි පුද්ගලයා මෙම සූත්‍රය සඳහන් කරන්නේ ජෝති ජෝති පරායන පුද්ගලයා හැටියටයි. ඒ නිසා ගිහි පැවිදි අපි හැමදෙනාම අඳුරෙන් එළියට අවුත් ආලෝකමත් ජීවිතයක් ඇතිකර ගනිමු.

